# කුට්ටම් පොකුණ



ලක්ෂ්මන් කොඩිතුවක්කු



# ලේ සහ තෙල්

අද මුළු ලොවම හෙල්ලුම් කා ඇති ප්‍රධාන මාතෘකාවකි තෙල්. තෙල් සම්පත නිසා විනාශ වු රටවල් සේම තෙල් වලින් විරාජමානව බැබලෙන රටවල් වලින්ද සමන්විත ලොවේ ලේවල වටිනාකමට වඩා තෙල්වල වටිනාකම ඉහළයමින් පවතී. අමෙරිකාව බ්‍රිතාන්‍යය ආදී රටවල් වල තෙල් සම්පත හීන වුවත් තෙල් ඇති රටවල් මෙල්ල කරමින් අදත් ලොවේ බැබලෙන ඔවුන්ගේ අද සටන ඇත්තෙත් ඉරානය සමඟයි. ලිබියාව, ඉරාකය බින්දුවට බස්සා කුවේටය, සවුදිය, ඩුබායි ආදී රටවල් තම පාලනයට නතු කර ගනිමින් සිටින ඔවුන්ට මෙල්ල කරගත නොහැකි තෙල් සම්පත බහුල රට බවට පත්ව ඇත්තේ ඉරානයයි. ඉරානයට ආර්ථික සම්බාධක පමණක් පනවා තාවකාලික වින්දනයක් ලබා බටහිර රටවල් තවමත් මාන බලන්නේ ඉරාකයට හා ලිබියාවට කළ දේ ඉරානයට අත්පත් කර දෙන්නටය. එහෙත් තවමත් නොසැලී අභීතව තම ප්‍රතිවාදියාට මුහුණ දෙන ඉරානයට තවමත් ශක්තියක් වී ඇත්තේ රුසියාවේ සහයෝගයයි.

අපේ රටට ප්‍රධානවම තෙල් සපයන රටක් වන්නේ ද ඉරානයයි. ඉරානය දී ඇති සහන රැසක් නිසා ශ්‍රී ලංකාවේ තෙල් සැපයුම සියයට 90 ක් පමණ සිදුවන්නේ ඉරානය මඟිනි. ඒත් මෑතකදී ලෝක තෙල් වෙළඳපොළේ තෙල් බැරලයක මිල ඉහළ ගියා පවසමින් ශ්‍රී ලංකාවේද තෙල් මිල ඉහළ ගියේ ලෝකයේ තෙල් මිලත් සමඟ සෘජුවම සම්බන්ධ ආර්ථික හා නිෂ්පාදන වියදම්වල මිලද ඒ හා සමානව ඉහළ ගියේ නොසිතූ විරූ අන්දමිනි. ආහාර, නිෂ්පාදන, ගමනාගමන කටයුතු වලට සම්බන්ධ සියලුම ක්ෂේත්‍රයන් වල මිල ඉහළ දමමින් රජය ජනතාව පිට බර පටවා නිදහස් වන්නට මාන බලනාවිට ජනතාවට කරන්නට කිසිවක් ඉතිරි නොවේ. ඔවුන්ට කල හැකි එකම දෙයවන්නේ පාරට බැස "මිල අඩු කරව්" කියා උද්ඝෝෂණය කිරීම පමණි.

එදා විජයානන්ද දහනායක මන්ත්‍රීවරයා අමුඩයකින් සැරසී බර කරත්තයකින් පාර්ලිමේන්තුවට පැමිණියේ තෙල් මිල ශත වලින් වැඩි වු යුගයකය. ඒත් එදා අපේ රටේ ප්‍රවාහනය එතරම් දියුණු මට්ටමක සිදු වු යුගයක් නොවේ. රථවාහන ලක්ෂයකට වඩා නොතිබූ ප්‍රධාන මං මාවත් එතරම් සංවර්ධනය නොවු යුගයක ජනතාවගේ ප්‍රධාන පොදු ප්‍රවාහන සේවය වුයේ ලංගමයි. එදා ශතවලින් එහාට මෙහාට වු තෙල් මිල අද ඉහල යන්නේ රුපියල් තිස් පහක්, හතලිහක් තරම් වු ජනතාවට දරාගත නොහැකි වන විශාල මුදලකිනි.

පීඩනයට හා ආර්ථික අසහනයට පත්වන ජනතාව තම දුක්ගැනවිල්ල කියා ගත හැකි පිරිසිදු දේශපාලනයක් අද අප රට තුළ නැත. ඩලස් අලහප්පෙරුම ඇමතිවරයාද, මෛත්‍රීපාල සිරිසේන ඇමතිවරයාද තෙල් මිල වැඩි වු අන්දම වැරැ බව දනී. එය තම ආණ්ඩුවේ ජනප්‍රියත්වයට හානිදායක බවද දනී. ඔවුන් මාධ්‍යය සාකච්ඡා පවත්වා පිරිසිදු වන්නට හදන්නේ ලෝක තෙල් වෙළඳපොළේ මිළට දෙස් දොවොල් පවරමිනි. ඒත් විපක්ෂය මාන බලන්නේ මේ තෙල් මිලෙන් බලය ලබාගැන්මට යයිද ඔවුන් චෝදනා කරන්නේ බලයක් ලබාගැන්මට අසළවත් නැති විපක්ෂයට වඩා ජනතාවගෙන් එන මෙම පීඩනය විපක්ෂය පිට දමා ඇඟපත බේරාගැන්මට බව කවුරුත් දන්නා කාරණයක් බවට පත් කරමිනි.

විද්වතුන්, ජනමාධ්‍ය සේම විපක්ෂයේ දුර්වලකම් ආශිර්වාදයද ලබාගනිමින් රජය මේ යන ඒකාධිපති ගමන අපේ රටට එතරම් සුභදායක නොවේ. තමන්ගේ චිත්‍රපටියට ආධාර ලබාගැනීමට රජයට කඩේ යන කලාකරුවන්ට හා රජයේ මුදල් වලින් පත්තර කන්තෝරු දුවන ජනමාධ්‍යවේදීන්ට තෙල් මිල වැඩිවීම හා ජනතාව පාරට බැසීම විහිළුවක් බවට පත්ව ඇත්තේ ඒ නිසාය. ඔවුන්ගේ ප්‍රධාන මාතෘකාව වී ඇත්තේ අධිවේගී මාර්ගය හා ආසියාවේ ආශ්චාර්යයි. අප රටේ අදටත් එදාවේල හම්බකරමින් ජිවත්වන මිනිසුන්ට මේ පත්තර වලින් හා විද්වතුන්ගෙන් ලැබෙන හා ලබාගන්නට දෙයක් නැත. ඔවුන් මේ පුවත්පත් මිලදී ගන්නේද නැත. පුවත්පතක් මිලදී ගන්නට තබා හාල් සේරුවක් මිලදී ගැනීමට තරම් වත්කමක් නැති මිනිසුන්ට ආශ්චර්ය එක්තරා සිහිනයක් පමණි.

මහමාර්ග කාපට් කිරීමට වඩා බැරෑරුම් හා සංකීර්ණ ප්‍රශ්න බොහෝ තිබුණත් ඒ ප්‍රශ්න පිළිබඳව ඇස්කන් පියාගෙන සිටින ඇමතිවරුන්ට රටේ ජනතාව විඳින දුක දැනෙන්නේ වෙනත් ආකාරයකටය. පීඩනය වැඩි වී පාරට බසින වැඩ කරන ජනතාව උසිගන්වන්නේ විදෙස් බලවේග හා විපක්ෂය මඟින් බව පවසමින් වැඩිවන ජීවන වියදම හා උද්ධමනය පිළිබඳව හාංකවිසවියක්වත් නොදන්නා ගානට ඉන්නට මාන බැලීම, ජනතාව තව තවත් ප්‍රපාතයට තල්ලු කිරීමකි.

"පොල්ල ගැනීමට පෙර බල්ලන් හඳුනාගනිමු" යන පෙබරවාරි මස දහනව වන දින ඉරිද සිළුමිණ කතුවැකියෙන් පවසන්නේ කුමක්ද? කතුවරයා එය ලියා ඇත්තේ පොලීසියටය. විදෙස් බලවේග හා ජනතාව උසිගන්වන විපක්ෂයට නොරැවටී ක්‍රියාකරන ලෙසටය. එහෙත් පාරට බසින ජනතාව සියල්ල කළහාකාරීන්ද? ඔවුන් සියල්ල මෙහෙයවන්නේ විදෙස් බලවේග හා විපක්ෂයද? ගල්, මුල්, බෝතල් අතැතිව සිටින සුළු පිරිස හා පීඩනය වැඩිවී අඬා වැටෙන දස දහස් වැඩකරන ජනතාව එකම තක්සේරුවෙන් මැනිය හැකිද? රජයේ මුදල් යනු ජනතාවගේ මුදල්ය. "සිළුමිණ" පුවත්පත යැපෙන්නේ ජනතාවගේ මුදලෙනි. සිළුමිණ ඇතුළු ලේක් හවුස් වැඩකරන ජනතාවට මෙම පීඩනය දැනෙන්නේ නැතිද? ඒ නිසා හෙට අනිද්දා පාරට බසින ජනතාව පිළිබඳව රජය මීට වඩා වගකීමකින් යුතුව සිතිය යුතුය.

එද අර්ථසාදක අරමුදල හා නිදහස් වෙළඳ කලාපයේ ප්‍රශ්නයෙන් වෙඩි වැදී මිය ගිය අහිංසක තරුණයාට රුපියල් ලක්ෂ පහක් පමණක් දී ඇඟ බේරාගත්තද, මෙද හලාවතදී මියගිය ධිවරයාට රුපියල් ලක්ෂ පහක් දී ඇඟබේරාගැනීමට රජයට නොහැකිය. අද මේ පීඩිත තරුණ ජනතාව සියල්ල මියයන්නේ අණක් ගුණක් නැති පාලනයක් නැති පොලිසියේ හා හමුදාවේ දුර නොදකින නුවණ හමුවේ වුවත්, මේ සියල්ලට අනාගතයේදී වගකිවයුතු වන්නේ රට පාලනය කරන රජය නිසාවෙනි. අනාගතයේදී මෙයට වඩා පාරට බසින ජනතාව වැඩිවනු ඇත. පොලිස් වෙඩි පහරවලින් මියයන ජනතාවද වැඩිවනු ඇත. මේ සියල්ලන්ට රුපියල් ලක්ෂ ගණන්වලින් වන්දි ගෙවීමට රජයට මුදල් මුද්‍රණය කිරීමට සිදුවේ. රුපියල තව තවත් පාකිරීමට සිදුවේ. මිලියන ගණන් වන්දි ගෙවනවාට වඩා අකාර්යක්ෂම ආර්ථික කළමණාකරණය නිසි සැලැස්මක් ඇතිව සකසුරුවම් කිරීම මීට වඩා කෙතරම් වටිනේද? වටිනා ජීවිත කෙතරම් ඉතිරි කර ගත හැකිද ? කුඩා දරුවන්ට අම්මෙක් අප්පෙක් නැති කරනවාට වඩා, රුපියල් ලක්ෂ පහක් දී ඇඟ බේරාගන්න වඩා ඒ ගැන රජයට පහද දීමට කිසිවෙකුත් මේ රජයේ නැතිද? කිසිදු සැලැස්මක් නැති, බලය ලබාගැනීමට අසලකවත් නැති, අපි බලයට පැමිණියොත් ජනතාව ට දෙන්නේ කුමක්ද යන්නවත් කියාගන්නට බැරි විපක්ෂයේ ඡන්ද ගොඩ වැඩි කරමින්, ඔවුන්ව ජනතාවාදී කරමින් සිටිනවාට වඩා මේ ප්‍රශ්න ගැන අවධානය යොමු කිරීමට රජයට සැලැස්මක් නැතිද ? හලාවත, කටුනායක ඝාතන මුළු රට පුරාම පැතිරෙන්නට පෙර රජය මේ ගැන සිතිය යුතුය.

දරාගත නොහැකි අන්දමින් ඇමති මණ්ඩල නඩත්තු කරමින්, ඔවුන්ට දුෂණය, වංචාව මහා පරිමාණයෙන් කරන්නට ඉඩ සලසමින් රජය යන ගමන තව දුරටත් ගියහොත්, නෙළුම් පොකුණෙන්වත්, අධිවේගී මාර්ගයෙන්වත්, හම්බන්තොට වරායෙන්වත් කිසිදු ඵල ප්‍රයෝජනයක් නැත. විදෙස් බලවේග හා විපක්ෂයට දොස් පවරමින් සිටිනවාට වඩා රජයේ ආකාර්යක්ෂමතාවය සිළුමිණ කතුවරයාට පෙන්වාදීමට හැකිනම් රජයේ මුදලින් නඩත්තු වන ලේක් හවුසියෙන් ජනතාවට විශාල ඵල ප්‍රයෝජනයක් ලැබෙනු ඇත.

මුළු ලොවේම තෙල් මිල ඉහළ යන බව සත්‍යයකි. අනාගතයේදී ලේ වලටත් වඩා තෙල් වල වටිනාකම තව තවත් ඉහළ යන බවද සත්‍යයකි. වැඩිවන ජනගහණය හා ලෝක ආර්ථික අර්බුදය හමුවේ ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය තව තවත් පහළ යන බවද සත්‍යයකි. එහෙත් ඊටත් වඩා වැඩියෙන් අප රටේ දුෂණය හා වංචාව, අනිසි කළමණාකරණයද ඉහළ යන බව රටේ ජනතාව දන්නා සත්‍යයකි. දියුණුවෙන කුඩා රටක් වශයෙන් අප මේ සියල්ලට මුහුණ දිය යුත්තේ එයට විසඳුමක් දීමෙන් පමණි. එසේ සිදු නොවුවහොත් මේ රජයේද ආයුෂ ප්‍රමාණ්‍ය තව තවත් ක්ෂයවනු ඇත.

GATEWAY
LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial Law
- Sale of Business
- Conveyancing
- Powers of Attorney
- Wills & Estate Planning
- Migration Law

Senanie Kurukularatne LL.B
Barrister & Solicitor
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

T 03 8786 9682
F 03 8786 9681
M 0414 660 513
gateway5@bigpond.net.au
DX 30463 Berwick VIC 3806
PO Box 730 Berwick VIC 3806
17 Glenview Rise Berwick VIC 3806 Australia